මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் அமைச்சு
MINISTRY OF FINANCE AND PLANNING

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01. இலங்கை | The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)- 11 - 2449823
වෙබ් අඩවිය / வெப்சைட் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: බිඩී/ඊඊ/118/01/බිපී/2013
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2013.06.21

අයවැය චක්‍රලේඛ අංක : 160

ලේකම්, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය
කොමසාරිස් ජනරාල් , ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ ජනරාල්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ ජනරාල්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
අධ්‍යක්ෂ, ජාතික පොහොර ලේකම් කාර්යාලය
සහ සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්

## කෙතට අරුණ පොහොර දිරිය වැඩසටහන යටතේ සහනාධාර පොහොර ලබන ගොවීන් සඳහා වන වගා රක්ෂණාවරණය

නියඟය, ගංවතුර හා වන අලින්ගෙන් සිදුවන ආපාදාවලින් වගා කටයුතුවලට ඇතිවිය හැකි හානි නිසා ගොවි ප්‍රජාවට මුහුණදීමට සිදුවන දුෂ්කරතාවලට පිළියමක් වශයෙන් අනිවාර්ය රක්ෂණ ක්‍රමයකට ගොවීන් දායක කර ගැනීමට 2013 අයවැය යෝජනා යටතේ තීරණය කර ඇත. ඒ අනුව, 2013 වර්ෂයේ යල කන්නයේ සිට සහනාධාර පොහොර ලබන සෑම ගොවියෙකුම කිලෝ ග්‍රෑම් 50 ක රසායනික පොහොර මල්ලක් මිළ දී ගැනීමේ දී, රු. 150/- ක අනිවාර්ය රක්ෂණ දායකත්වයක් යටතේ ජාතික රක්ෂණ භාර අරමුදල මගින් ක්‍රියාත්මක කරනු ලබන රක්ෂණ ක්‍රමයක සාමාජිකයකු කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

1. වගා රක්ෂණ ප්‍රතිලාභීන්

මෙහි පළමු පියවර ලෙස, සහනාධාර පොහොර ලබා ගන්නා වූ ගොවීන් සඳහා මෙම රක්ෂණාවරණය ක්‍රියාත්මක වේ.

2. රක්ෂණය යටතේ ආවරණය වන හානි

i. ගංවතුර
ii. නියඟය
iii. වන අලි

3. ආවරණ මට්ටම

පූර්ණ හානියකදී හෙක්ටයාර් 01 කට රු. 25,000/- (අක්කරයකට රු. 10,000/-) දක්වා උපරිම සීමාවකට යටත්ව පහත පරිදි රක්ෂණ වන්දි ප්‍රතිලාභ හිමිවේ.

| හානිය සිදුවන අවස්ථාවේ වගාවේ අවධිය / වගාවේ ප්‍රමාණය | වපුරා දින 30 ක් ඇතුලත මුළු වන්දි මුදලෙන් 40% (2) | වපුරා දින 31 සිට වගාවේ මල් හට ගැනීම දක්වා මුළු වන්දි මුදලෙන් 60% (3) | මල් හටගැනීමේ සිට අස්වැන්න නෙළීමට ආසන්න අවස්ථාව දක්වා මුළු වන්දි මුදල100% (4) |
|---|---|---|---|
| අක්කර 01 ට හෝ | රු. 4,000/- | රු. 6,000/- | රු. 10,000/- |
| හෙක්ටයාර 01 ට | රු. 10,000/- | රු. 15,000/- | රු. 25,000/- |

ඉහත තීරු අංක (2), (3) හා (4) හි සඳහන් වන්දි ලැබීමට නම් එම එක් එක් අවස්ථාවන්හිදී වගාව පූර්ණ හානියට ලක්ව තිබිය යුතුය. එයට වඩා අඩු හානියක් වී ඇත්නම් හිමිවිය යුතු වන්දි ප්‍රමාණය හානියේ ප්‍රමාණයට අනුරූපව අඩුවේ.

4. රක්ෂණ දායක මුදල් අයකිරීම සහ රක්ෂණ කටයුතු ක්‍රියාත්මක කිරීම

i. වගා කන්නයක දී කිලෝ ග්‍රෑම් 50 ක එක් සහනාධාර පොහොර මිටියකින් රු. 150/- ක් වන පරිදි (කි.ග්‍රෑ. 1 ට රු. 3/-) මිළ දී ගන්නා පොහොර ප්‍රමාණයට අනුපාතිකව අදාල රක්ෂණ වාරික මුදල අයකරනු ලැබේ.

ii. ගොවීන්ට සහනාධාර පොහොර අලෙවි කරනු ලබන ගොවිජන සේවා මධ්‍යස්ථාවලින් හා සමුපකාර සමිති මගින්, ගොවීන් පොහොර මිළ දී ගන්නා අවස්ථාවේ දී මෙම රක්ෂණ දායක මුදල් අයකරනු ලැබේ.

iii. ගොවීන්ගෙන් අයකරනු ලබන රක්ෂණ දායක මුදල් එම දායක මුදල් අයකරනු ලබන ආයතනයන්හි ගිණුමක තැන්පත් කර, එම මුදල් සතියකට වරක් මහජන බැංකුවේ රුජිණ ශාඛාවේ ජාතික රක්ෂණභාර අරමුදලේ අංක 033-1005-0-2467951 දරණ ගිණුමට බැර කිරීම සඳහා ඇමුණුම අංක I ආකෘතියට අනුව සහතික කරන ලද ලදුපත් උපලේඛන ජාතික රක්ෂණභාර අරමුදල වෙත ලබාදිය යුතුය.

iv. ගොවීන් වෙත නිකුත් කරනු ලබන මුදල් භාර ගැනීමේ ලදු පතේ පොහොර සඳහා අයකරනු ලබන මුදල සහ රක්ෂණාවරණය සඳහා අයකරනු ලබන දායක මුදල වෙන වෙනම සටහන් කල යුතු ය. මෙම රිසිට් පත (මුල් පිටපත) වගා හානි රක්ෂණාවරණය ලබාගැනීමේ දී අයදුම්පත (ඇමුණුම 02) සමග ඉදිරිපත් කලයුතු බවට ගොවීන් වෙත උපදෙස් ලබාදිය යුතු ය.

v. රක්ෂණ හිමිකම අදාල රක්ෂණලාභියා වෙත හිමිවන අතර යම් හේතුවක් මත රක්ෂණ හිමිකරුගේ මරණයක දී, එම හිමිකම ඔහුගේ/ඇයගේ ස්වාමි පුරුෂයාට/භාර්යාවට/දරුවන්ට ලැබෙනු ඇත.

vi. සහනාධාර පොහොර ලබා ගන්නා ලද කන්නය සඳහා පමණක් මෙම රක්ෂණාවරණය අදාල වේ.

5. වගා හානි වාර්තා කිරීමේ ක්‍රමවේදය :

වන්දි ඉල්ලුම් කරන රක්ෂණලාභියා විසින් හානිය සිදු වී දින 30 ක් ඇතුලත, රක්ෂණ වන්දි අයදුම්පත, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරගෙන් නොමිලයේ ලබාගෙන, නිසි පරිදි පුරවා කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර, මහවැලි ඒකක කළමනාකරු හෝ වාරිමාර්ග ව්‍යාපෘති කළමනාකරු වෙත ඉදිරිපත් කළ යුතුය.

කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර හෝ මහවැලි ඒකක කළමනාකරු විසින් අයදුම් පත්‍රයේ සඳහන් තොරතුරු ගොවි සංවිධානයේ සභාපති හා ලේකම් සමග පරීක්ෂා කර, නිරවද්‍යතාවය තහවුරු කර, ප්‍රදේශයේ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතු ය.

ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී රක්ෂණ වන්දි අයදුම්පත්‍රය ලියාපදිංචි කර, එහි ඇති තොරතුරු පරීක්ෂා කර වන්දි ගෙවීම සඳහා නිර්දේශය ලබාගැනීමට මෙහි 06 හි සඳහන් ප්‍රාදේශීය වගා හානි රක්ෂණ තක්සේරු කමිටුව වෙත යොමු කළ යුතු ය.

6. වගා හානි තක්සේරු කිරීම - ප්‍රාදේශීය වගා හානි රක්ෂණ තක්සේරු කමිටුව

වගා හානිය වාර්තා කිරීමෙන් අනතුරුව, අදාල වගා හානිය හා වන්දි මුදල නිශ්චය කිරීම සඳහා පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත සහනාධාර පොහොර ලබන ගොවීන් සඳහා වන ප්‍රාදේශීය වගා රක්ෂණ තක්සේරු කමිටුවක් මගින් ක්‍රියාත්මක විය යුතු ය.

අ. ප්‍රාදේශීය ලේකම් (කමිටුවේ සභාපති)
ආ. කෘෂිකර්ම සහකාර අධ්‍යක්ෂ හෝ අවශ්‍ය අවස්ථාවන්හි දී වනජීවී/වාරිමාර්ග දෙපාර්තමේන්තු නියෝජිතයින්/මහවැලි නේවාසික ව්‍යාපෘති කළමනාකරු
ඇ. ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී
ඈ. හානියට පත් වගා බිම හඳුනා ගැනීම සඳහා කොට්ඨාශ භාර කෘෂිකර්ම උපදේශක /කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර

මෙම වගා තක්සේරු කමිටුව අදාල වගාව හානියට පත්ව ඇත්තේ වගා කර කවර අවධියක ද යන්න මෙහි 3 හි සඳහන් පරිදි දක්වා ඒ අනුව හානිය තක්සේරු කළ යුතුය.

7. වන්දි ගෙවීම

ඉහත ප්‍රාදේශීය වගා හානි රක්ෂණ තක්සේරු කමිටුවේ නිර්දේශ, ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී විසින් දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/සහකාර කොමසාරිස් වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, වන්දි ගෙවීමේ ඉදිරි කටයුතු සඳහා එම ඉල්ලුම්පත්, සභාපති, ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ඉදිරිපත් කළ යුතු ය. මෙහිදී, අනුමත සියළු ගෙවීම් ජාතික රක්ෂණ භාර අරමුදල විසින් අදාල රක්ෂණලාභියාගේ බැංකු ගිණුම වෙත බැර කරනු ලැබේ.

8. වගා රක්ෂණ වැඩ පිළිවෙල මෙහෙයවීම :

පොහොර සහනාධාරය සමග ක්‍රියාත්මක වන වී වගා රක්ෂණ වැඩසටහන පහත නිලධාරීන්ගෙන් සමන්විත දිස්ත්‍රික් වගා රක්ෂණ කමිටුවේ අධීක්ෂණය හා මගපෙන්වීම යටතේ සිදු වේ.

i. දිස්ත්‍රික් ලේකම්/දිසාපති
ii. දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ
iii. දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/සහකාර කොමසාරිස්
iv. ජාතික පොහොර ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ

වගා රක්ෂණ වැඩපිළිවෙලට අදාල සියළු තොරතුරු ඇතුලත් දත්ත පද්ධති, ගොවිජන සේවා මධ්‍යස්ථාන, ගොවිජන සේවා දිස්ත්‍රික් කාර්යාල සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේ පවත්වා ගතයුතු වේ.

පී.බී. ජයසුන්දර
මහ භාණ්ඩාගාරයේ ලේකම්

පිටපත් :

1. ජනාධිපති ලේකම්
2. විගණකාධිපති
3. සභාපති, ජාතික රක්ෂණ භාර අරමුදල

ඇමුණුම 01

අනුක්‍රමික අංකය ....................

### ගොවි මහත්ම/මහත්මීන්ගෙන් අයකරන ලද රක්ෂණ වාර මුදල් පිළිබඳ වාර්තාව

ගොවිජන සේවා මධ්‍යස්ථානය : ..........................................................

වර්ෂය :-

කන්නය - යල/මහ.........../.............../...............

| අනු අංකය | ගොවි මහතාගේ/ මහත්මියගේ නම (2) | හැඳුනුම්පත් අංකය (3) | නිල කූවිතාන්සි අංකය (4) | නිකුත් කරන ලද පොහොර ප්‍රමාණය (කි.ග්‍රෑ.) (5) | අයකරන ලද රක්ෂණ වාර මුදල රු. (6) | වෙනත් කරුණු (7) |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

සහතිකය :

ඉහත තීරු (2) හි දක්වා ඇති ගොවි මහත්ම/මහත්මීන්ගේ නම්, ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ඇති ගොවි මහත්ම/මහත්මීන්ගේ නාම ලේඛනයට අනුව නිවැරදි බවත්, ඉහත තීරු (5) හි පිළිවෙලින් දක්වා ඇති නිකුත් කල පොහොර ප්‍රමාණය හා වටිනාකම, නිකුත් කරන ලද නිල කූවිතාන්සි (තීරු 04) සමග සැසඳෙන බවත්, මෙයින් සහතික කරන අතර, මුළු වටිනාකම වන රු. ........................ මහජන බැංකුවේ, රුජ්ණ ශාඛාවේ ජාතික රක්ෂණභාර අරමුදලේ ගිණුම් අංක 033-1005-0-2467951 වෙත බැර කර ........................... බැංකුවේ ..................................ශාඛාව විසින් නිකුත් කරන ලද බැර නිවේදනය/ජාතික රක්ෂණභාර අරමුදල නමින් නිකුත් කරන ලද අංක ........................... දරණ චෙක්පත මේ සමග ඉදිරිපත් කරමි.

......................................................

ගොවිජන සේවා ප්‍රාදේශීය නිලධාරී

(අත්සන හා නිල මුද්‍රාව)

දිනය : ................................

(අනවශ්‍ය වචන කපා හරින්න)

සභාපති
ජාතික රක්ෂණභාර අරමුදල

**කෙතට අරුණ පොහොර දිරිය වැඩසටහන යටතේ වගා රක්ෂණාවරණයට අදාල වන්දි ලබාගැනීමේ අයදුම්පත**

ගොවිජන සේවා මධ්‍යස්ථානය [ ]

1) ගොවි මහතාගේ/මහත්මියගේ නම : ..............................................................................

2) ලිපිනය : ..............................................................................

3) ජාතික රක්ෂණ භාර අරමුදලේ ලියාපදිංචි අංකය : ..............................................................................

4) ජාතික හැඳුනුම්පත් අංකය : ..............................................................................

5) ගොවිජන සේවා බල ප්‍රදේශය : ..............................................................................

6) කෘ.ප.නි.ස. කොට්ඨාශය : ..............................................................................

7) ගොවි සංවිධානයේ නම : ..............................................................................

8) කුඹුරු ඉඩමේ
   1. නම : ..............................................................................
   2. අංකය : ..............................................................................
   3. වගා කළ ඉඩමේ ප්‍රමාණය : අක්කර : ............ රූඩ්: ............. පර්චස් : .............

9) හානිය සිදු වූ වර්ෂය : ................. වගා කරන ලද කන්නය : ..............................................

10) ඔබගේ කුඹුරු ඉඩමට යාබද කුඹුරු ඉඩම්වල අස්වනු තත්ත්වය/හානි තත්ත්වය : ..............................................................................
..............................................................................

11) ගෙවන ලද රක්ෂණ දායක මුදල : රු. .................................... ලදුපත් අංකය : ..................................
(ඡායා පිටපතක් අමුණන්න)

12) හානියේ ස්වභාවය : ..............................................................................
..............................................................................
..............................................................................

13) ඉල්ලුම් කරන වන්දි මුදල : රු. ..............................................................................
   I. ඔබ සහනාධාර පොහොර ලබාගනු ලබන වී වගාවන් සඳහා වෙනත් වගා රක්ෂණ ක්‍රමයකට දායක වී තිබේ ද? ඔව්/නැත
   II. දායක වී තිබේනම්, අදාල රක්ෂණය පිළිබඳ විස්තර සඳහන් කරන්න ..............................................
   ..............................................................................
   ..............................................................................

14) රක්ෂණ වන්දි මුදල බැර කළයුතු බැංකු ගිණුම් අංකය : ..............................................................
(බැංකු ගිණුමේ මුල් පිටුවේ ඡායා පිටපතක් අමුණන්න)

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහ මෙම රක්ෂණාවරණය යටතේ වන්දි ලබාගැනීමට මා හට සුදුසුකම් ඇති බවට සහතික වෙමි.

..............................................................
ගොවි මහතාගේ/මහත්මියගේ අත්සන

දිනය : ..........................................

ගොවි සංවිධානයේ නිර්දේශය :

ඉහත විස්තර සත්‍ය හා නිවැරදි බවට සහතික කරමු.

................................................ ........................................

සභාපති ලේකම්

දිනය : ................................ දිනය : ................................

කෘ.ප.නි.ස./මහවැලි ඒකක කළමනාකරු/වාරිමාර්ග ව්‍යාපෘති කළමනාකරුගේ නිර්දේශය :

ඉහත විස්තර සඳහන් ............................................................................ මහතා/මහත්මියගේ වගා හානියට අදාල රක්ෂණ හිමිකම් සඳහා අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි/අයදුම්පත නිර්දේශ නොකරමි.

නිර්දේශ නොකිරීමට හේතුව : ..............................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................

කෘ.ප.නි.ස./මහවැලි ඒකක කළමනාකරු/වාරිමාර්ග ව්‍යාපෘති කළමනාකරු

(අත්සන හා නිල මුද්‍රාව)

දිනය : ................................

ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී සහතිකය :

මගේ අංකය : .........................

ඉහත විස්තර සඳහන් ............................................................................ මහතා/මහත්මියගේ වගා හානියට අදාල රක්ෂණ හිමිකම් සඳහා අයදුම්පත නිර්දේශ කර ප්‍රාදේශීය වගා හානි තක්සේරු කමිටුවට ඉදිරිපත් කරමි/අයදුම්පත නිර්දේශ නොකරමි.

නිර්දේශ නොකිරීමට හේතුව : ..........................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

.......................................................

ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී

(අත්සන හා නිල මුද්‍රාව)

දිනය : ......................................

ප්‍රාදේශීය වගා හානි තක්සේරු මණ්ඩලයේ නිර්දේශය:

1. හානියේ ස්වභාවය : ☐ පූර්ණ හානි ☐ අර්ධ හානි ☐ සුළු හානි

2. වගාවේ අවධිය :
   අ) ප්‍රථම අවස්ථාව : ☐ (වපුරා දින 30 දක්වා වගා හානි සඳහා ලබාගත් ආවරණයන් 40%)

   ආ) දෙවන අවස්ථාව : ☐ (වපුරා දින 31 සිට වගාවේ මල් හටගැනීමේ අවස්ථාව දක්වා වන හානි සඳහා ලබාගත් ආවරණයන් 60%)

   ඇ) අවසන් අවස්ථාව : ☐ (මල් හටගැනීමේ සිට අස්වැන්න නෙලීමට ආසන්න අවස්ථාව දක්වා වගා හානි සඳහා 100%)

3. විශේෂ කරුණු : ……………………………………………………………………………………………
……………………………………………………………………………………………
……………………………………………………………………………………………

4. නිර්දේශිත වන්දි මුදල : රු. ………………………………………………………………………………..

ඉහත සඳහන් ……………………………………………………………………… මහතාගේ/මහත්මියගේ වගා හානියට අදාල රක්ෂණ හිමිකම නිර්දේශ කර තක්සේරු වාර්තාව මේ සමග ඉදිරිපත් කරමි.

තක්සේරු මණ්ඩලය

| සාමාජික නම | තනතුර | අත්සන |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

මගේ අංකය : ………………………..

නිර්දේශ කරමි/නිර්දේශ නොකරමි.

……………………………………………………
ප්‍රාදේශීය ලේකම් (කමිටුවේ සභාපති)

දිනය : ……………………………..